චක්‍රලේඛ අංක :03/2005

මගේ අංකය:පු.නො. 10/30/13/2004,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 280, කෙළින් වීදිය,
කොළඹ 11.
2005.02.15 දින.

සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

**රජය විසින් නිකුත් කර ඇති ප්‍රදාන පත්‍ර කොන්දේසි කඩවන ආකාරයට නව ඔප්පු ලියාපදිංචි කිරීම.**

ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) වන වගන්තිය යටතේ නිකුත් කර ඇති දීමනා පත්‍ර, ඉඩම් වල අයිතිය අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ පූර්ව ලිඛිත අවසරය නිත් තොරව බැහැර කළ නොහැකි වුවත්, එකී කොන්දේසිය කඩ කරමින් සමහර පුද්ගලයින් විසින් නොතාරිස් ඔප්පු සකසා අදාල ඉඩම්වල අයිතිය බැහැර කරන බවත්, එවැනි ඔප්පු ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලවල ලියාපදිංචි කරන බවත්, තොරතුරු ලැබී ඇතැයි ඉඩම් කොමසාරිස්වරයා මා වෙත දන්වා ඇත.

02. ඒ නිසා, ඔප්පු ලියාපදිංචි කිරීමේදී ඒවායේ සඳහන් ඉඩම් රජයේ ඉඩම් බවට හඳුනාගත හැකි නම් හා සැකයක් ඇති වන්නේනම් එකී දේපල අයිතිය බැහැර කිරීමට අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ලිඛිත අනුමැතිය ලබාගෙන ඇද්ද යන්න පිළිබඳව විශේෂයෙන් සැළකිලිමත් වන ලෙස සියළුම ලියාපදිංචි කිරීමේ නිලධාරීන්ට උපදෙස් දෙන ලෙස කාරුණිකව දන්වමි.

රෙජිස්ට්‍රාර් ජනරාල්.

පිටපත්:-
1. ඉඩම් කොමසාරිස්, .............. - දැ.පි.
2. සියළුම කලාප භාර නිලධාරීන් - දැ.පි.
3. විගණන අංශය - දැ.පි.